කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

ගණිතය

6 ශ්‍රේණිය   කාලය පැය 1 1/2 යි

I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

1. පහත රටා අතරින් වෘත්ත පමණක් අඩංගු රටා තෝරන්න.



a   b   c   d

2. එක්තරා සංගීතමය වැඩසටහනක් පෙ.ව. 11.30 සිට ප.ව. 1.45 දක්වා රූපවාහිනියේ විකාශනය විය. එය ආරම්භ වූ වේලාව සහ අවසාන වූ වේලාව සම්මත ආකාරයෙන් ලියා දක්වන්න
   a. ආරම්භ වූ වේලාව -
   b. අවසාන වූ වේලාව -

3. +2, -3 සහ 0 යන නිඛිල සංඛ්‍යා රේඛාවක ලකුණු කරන්න.

4. සියස්ථානයේ ඇති ඉලක්කමකින් නිරූපණය කළ හැකි උපරිම අගය කුමක්ද?

5. සුදුසු අගය යොදා හිස්තැන පුරවන්න.

   2448 + ……… = 3580

6. සංඛ්‍යා රේඛාවේ ලකුණු කර ඇති අගයයන් සලකා හිස්තැන් පුරවන්න .



   a. -2 > ……
   b. 2 < ……

7. 1 230 040 475 යන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න

8. එකතු කරන්න.

	පැය	මිනිත්තු
	10	47
+	05	13

9. හිස්තැන් පුරවන්න.
   a. 2500 x 10 = ………
   b. 77000 ÷ …… = 770

National e-learning Portal for The General Education

10. A භාජනයේ ඇති ජලය පරිමාව 750 ml නම්,
B භාජනයේ ඇති ජලය පරිමාව නිමානය කරන්න.



11. ඔබගේ උපන් දිනය අන්තර්ජාතික සම්මත ක්‍රමයෙන් ලියා දක්වන්න .

12. පහත සඳහන් කාලය පැය සහ මිනිත්තුවලින් දක්වන්න.
a. මිනිත්තු 132 = පැය .... මිනිත්තු ....

13. ගණක රාමුවෙන් නිරූපණයවන අගය කුමක්ද?



14. 5, 8, 9 සහ 7 යන ඉලක්කම්වලින් එක් ඉලක්කමක් එක්වරක් පමණක් යොදාගෙන ලිවිය හැකි කුඩාතම සංඛ්‍යාව ලියා එහි 5 න් නිරූපණයවන අගය ලියන්න.
a. කුඩාතම සංඛ්‍යාව =
b. 5 න් නිරූපණයවන අගය =

15. සුළු කරන්න.
12 x 14 x 100

16. -5 සහ +2 අතර ඇති සියලුම නිඛිල ලියන්න.

17. මළල ක්‍රීඩකයෙකු 1000m ධාවන ඉසව්ව 07:48:02 ට ආරම්භ කළේය. ඔහු එම ඉසව්ව නිමා කළේ 08:15:42 ට නම් ඒ සඳහා ඔහුට ගතවූ කාලය සොයන්න.

18. රශ්මි ගණිතය මාසික පරීක්ෂණය සඳහා ලබාගත් ලකුණු ප්‍රමාණය ආසන්න 10 ට වටැයූවිට 90 ක් වේ. ඇය ලබාගත් සැබෑ ලකුණ විය හැකි උපරිම සහ අවම අගයයන් ලියන්න.
a. උපරිම අගය =
b. අවම අගය =

19. ගණිතය ඇගයීමක් නිම කිරීමට හසිත ලබාගත් කාලය මිනිත්තු 89 ක් වන අතර සහන්ට ඒ සඳහා ගත වූ කාලය පැය 1 මිනිත්තු 25 කි. ඇගයීම පළමුව නිම කළේ කවුද? ඒ අනෙක් සිසුවාට වඩා කොපමණ කාලයකට පෙරද?

20. වරහන තුළින් ගැලපෙන පද තෝරා හිස්තැන් පුරවන්න.
ඕනෑම සෘණ නිඛිලයක අගය ධන නිඛිලයකට වඩා .... (වැඩි / අඩු) වන අතර බිංදුවේ අගය ඕනෑම සෘණ නිඛිලයකට වඩා.................... (වැඩි / අඩු) වේ.

(ලකුණු 2 x 20 = 40)

- ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න .

1.

a. එක්තරා ඉංග්‍රීසි චිත්‍රපටයක් පළමු අදියරේදී චිත්‍රපට ශාලාවේ පැය 1 මිනිත්තු 25ක් ප්‍රදර්ශනය කෙරේ. මිනිත්තු 15ක විවේක කාලය පෙ.ව. 11.50ට ආරම්භ වේ.එම චිත්‍රපටයේ දෙවන අදියර පැය 1 මිනිත්තු 28ක් ප්‍රදර්ශනය කෙරේ.

i. චිත්‍රපටය ආරම්භවූ වේලාව සොයන්න. (ලකුණු 3 යි)

ii. විවේක කාලය අවසාන වූ වේලාව සොයන්න. (ලකුණු 2 යි)

iii. චිත්‍රපටය නිමාවන වේලාව කුමක්ද? (ලකුණු 3 යි)

iv. විවේක කාලය ලබාදීමෙන් තොරව චිත්‍රපටය ප්‍රදර්ශනය වූයේ නම් චිත්‍රපටයේ ප්‍රදර්ශන කාලය සොයන්න. (ලකුණු 4 යි)

v. විවේක කාලය ලබාදීමෙන් තොරව චිත්‍රපටය ප්‍රදර්ශනය වූයේ නම් චිත්‍රපටය නිමාවන වේලාව ඉසායන්න. (ලකුණු 3 යි)

2.

a. P, Q සහ R යන නගර තුනෙහි එක්තරා දිනයක උෂ්ණත්ව සෙල්සියස් අංශකවලින් (°C) පහත සංඛ්‍යා රේඛාවේ දැක්වේ.



i. එම නගර තුනෙහි උෂ්ණත්ව වෙන වෙනම ලියන්න.

a. P =
b. Q =
c. R =

(ලකුණු 1 x 3 යි)

ii. උපරිම උෂ්ණත්වයක් සහිත නගරය කුමක්ද? (ලකුණු 1 යි)

iii. අවම උෂ්ණත්වයක් සහිත නගරය ලියන්න. (ලකුණු 1 යි)

iv. P නගරයේ උෂ්ණත්වය Q නගරයේ උෂ්ණත්වයට වඩා ඒකක කීයකින් අඩුද? (ලකුණු 2 යි)

v. විශාලම උෂ්ණත්ව වෙනස පවතින්නේ කුමන නගර දෙක අතරද? (ලකුණු 2 යි)

b. වරහන තුළින් සුදුසු පද තෝරා හිස්තැන් පුරවන්න.

i. 5 < …… (-100, 10, +5)

ii. +2 …. 2 (>, <, =)

iii. ….. > -20 (-17, -25, -21)

(ලකුණු 2 x 3 යි)

||

03)

a. i. "විසිතුන් බිලියන හය මිලියන දෙසිය පනස් දහස් හත්සිය හැත්තෑ අට" යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (ලකුණු 3 යි)

ii. එහි දහස්ථානයේ ඇති ඉලක්කම කුමක්ද? (ලකුණු 1 යි)

iii. එම සංඛ්‍යාවේ 6 න් නිරූපිත අගය ලියන්න. (ලකුණු 1 යි)

iv. විශාල සංඛ්‍යා භාවිතාවන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

b. පහත සංඛ්‍යා ආසන්න 10ට වටයන්න.

i. 43

ii. 295 (ලකුණු 2 x 2 යි)

c. සඳුනි සතු මුදල ආසන්න 10ට වටැයූවිට රු. 190කි. ඇය සතු මුදල 4න් ඉතිරි නැතිව බෙදේනම් ඇය සතු මුදලට තිබිය හැකි අගයයන් මොනවාද? (ලකුණු 4 යි)

04)

a. පහන පොත් වෙළඳසැලේ අභ්‍යාස පොත් 5ක් අඩංගු පොත් කට්ටලයක මිල රු. 200ක් වන අතර නැණස පොත් වෙළඳසැලේ එම වර්ගයේම අභ්‍යාස පොත් 4ක් අඩංගු පොත් කට්ටලයක් රු. 140කි.

i. පොත් වෙළඳසැල් දෙකෙහි එක් අභ්‍යාස පොතක මිල වෙන වෙනම සොයන්න. (ලකුණු 4 යි)

ii. වඩා ලාභදායී වන්නේ කුමන වෙළඳසැලෙන් පොත් මිලදී ගැනීමද? (ලකුණු 1 යි)

iii. පහන සහ නැණස පොත් වෙළඳසැල් දෙකෙන් ඉහත සඳහන් පොත් කට්ටල් 5බැගින් මිලදී ගන්නා පුද්ගලයින් දෙදෙනෙකුට වැයවන මුදල් ප්‍රමාණ අතර වෙනස සොයන්න. (ලකුණු 5 යි)

b. එක්තරා පාසලක සෑම ශ්‍රේණියකම පන්ති 5ක් ඇති අතර සෑම පන්තියකම ශිෂ්‍යාවන් 25ක් සහ ශිෂ්‍යයින් 15ක් බැගින් සිටිති.

i. එක් ශ්‍රේණියක සිටින මුළු ළමුන් ගණන සොයන්න. (ලකුණු 2 යි)

ii. එම පාසලේ 6ශ්‍රේණියේ සිට 11ශ්‍රේණිය දක්වා පන්ති ඇත්නම් පාසලේ සිටින මුළු ළමුන් ගණන සොයන්න. (ලකුණු 3 යි)

05)

a. i. ඉලක්කම් 4ක් භාවිතාකර ලිවිය හැකි විශාලතම සංඛ්‍යාව ලියන්න. (ලකුණු 2 යි)

ii. එම සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න. (ලකුණු 3 යි)

iii. එම සංඛ්‍යාවේ එක් එක් ඉලක්කමෙන් නිරූපණය වන අගයයන් ලියා දක්වන්න. (ලකුණු 1 x 4 යි)

iv. එම නිරූපිත අගයයන් අතර ඇති සම්බන්ධය කුමක්ද? (ලකුණු 3 යි)

b. පහත රූපයේ දැක්වෙන්නේ සමාන ප්‍රමාණයෙන් යුත් වෘත්ත දෙකකි. O සහ X යනු ඒවායේ කේන්ද්‍ර වේ. O ලක්ෂ්‍යයේ සිට A දක්වා ඇති දුර 3 cm නම් AB රේඛාවේ දිග සොයන්න.



(ලකුණු 3 යි)

12